**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ - ව්‍යාපෘතිය - ජජාසනි) 2013**

---

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ජ.ජා.ස.නි) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල් - පී 108 දරන ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල්, යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මගින් ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සහ එමගින් ආර්ථික සංවර්ධනයට දායක වීමයි. ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20,993 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 මාර්තු මාසයේ දී ආරම්භ කර තිබුණු අතර 2019 වන විට නිමකිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව සහ.

(ඈ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

**-----------------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.16,311,851 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වියදම** |
|---|---|
| ------------------- | -------------------------------------------- |
| | **රු.** |
| දේපළ, පිරියත හා උපකරණ | 138,558 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 9,081,098 |
| සිවිල් වැඩ | 1,074,850 |
| උපදේශක සේවා | 6,017,345 |
| | --------------- |
| | 16,311,851 |
| | ========= |

**5.** **විගණන නිරීක්ෂණ**

**----------------------**

**5.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාර්යයන්වලට අදාළ නොවන කාර්යයන් සම්බන්ධයෙන් දරන ලද රු.814,533 ක මුදලක් ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම් ලෙස අයකර තිබුණි.

(ආ) දුරකථන හා සන්නිවේදන පද්ධතිය සවිකිරීම සඳහා වැය කරන ලද රු.531,216 ක මුදලක්, එහි ප්‍රාග්ධන ස්වරූපය සැලකීමෙන් තොරව ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය ලෙස අයකර තිබුණි.

**5.2 නොසැසඳු ශේෂ**

**-----------------**

ව්‍යාපෘතියේ ලෙජර ගිණුම අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මුළු වියපැහැදම රු.5,361,141 ක් වු අතර, මහා භාණ්ඩාගාරයෙන් සපයන ලද තොරතුරු අනුව රු.5,465,650 ක මුදලක් වියපැහැදම් කර තිබුණි. රු.104,509 ක වෙනසට හේතුව පැහැදිලි කර නොතිබුණි.

**5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

ව්‍යාපෘතිය විසින් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබූ අතර ඒ වෙනුවට විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කළමනාකරණය කෙරෙන ව්‍යාපෘති ස්ථාවර වත්කම් සඳහා පොදු වාර්තාවක් පවත්වා තිබුණි.

**5.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ උපදෙස් වලට පටහැනිව රු.480,845 ක මුදලක් පොදු කාර්ය වියදම් ලෙස 2013 දෙසැම්බර් 31 දක්වා මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

**6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------------**

**6.1 අරමුදල් උපයෝජනය**

**-----------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යායනය හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වු මුදල් | | 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද ප්‍රතිපාදන | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජජාසනි | 12,381 | 20,993 | - | 5.3 |
| ශ්‍රීලංර | 3,751 | 6,336 | 7.5 | 7.5 |
| එකතුව | 16,132 | 27,329 | 7.5 | *12.8 |

* වර්ෂය අවසානයට අත්තිකාරම් හා ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

## 6.2 භෞතික කාර්ය සාධනය

-------------------------

විස්තරාත්මක සැලැස්ම උපදේශක විසින් සිදු කර තිබුණද, පාලම් ඉදි කිරීම් වැඩ 2013 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 6.3 උපදේශක සේවා

-----------------

පහත සඳහන් හේතුන් මත පාලම් ඉදි කිරීම සඳහා උපදේශක සේවා කොන්ත්‍රාත්තු ව්‍යාපෘතිය විසින් අවිධිමත්ව ප්‍රදානය කර ක්‍රියාත්මක කර තිබු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ලැබුණු තොරතුරු අනුව, 2013 පෙබරවාරි 09 දින උපදේශක විසින් ව්‍යාපෘතිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද 2012 ඔක්තෝබර් 21 දින ජපන් යෙන් 2,917,000 ක් හා රු.1,178,100 ක් උපදේශකට ගෙවා තිබූ බැවින් ව්‍යාපෘතිය සමඟ ගිවිසුමකට එළඹීමට පෙර උපදේශක විසින් වැඩ ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කොන්ත්‍රාත් කොන්දේසිවල 6.5 (අ) වගන්තිය අනුව, වැඩ පූර්ව අත්තිකාරම් සමාන වාරික 12 කින් අයකර ගත යුතුය. කෙසේ වුවද වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමෙන් තොරව රු.5,361,141 ක් වූ අතුරු ගෙවීමක් පසුව උපදේශකට ගෙවා තිබුණි. තවද වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ කාලය 2015 මාර්තු දක්වා දීර්ඝ කර තිබු නමුත් 2015 ජනවාරි 31 දක්වා වූ වැඩ පූර්ව අත්තිකාරම් මත ඇප බැඳුම්කරය දීර්ඝ කර නොතිබුණි.

(ඇ) උපදේශක සේවා ගිවිසුමේ යොමුගත කොන්දේසිවල අංක 6.5(1) වගන්තිය අනුව, අතුරු ගෙවීම් සහතිකවල සියලු විෂයයන් අවශ්‍ය ආධාරක ලියකියවිලිවලින් තහවුරු විය යුතුය. කෙසේ වුවද, ආධාරක ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් තොරව එකතුව රු.823,200 ක් වූ ගෙවීම් උපදේශක සේවා කාර්යයන් මත සිදුකර තිබුණි.

(ඈ) උපදේශක සේවා ගිවිසුමේ යොමුගත කොන්දේසිවල 03 වගන්තිය අනුව, විස්තරාත්මක සැලසුම් සඳහා සියලු පරීක්ෂණ හා මැනුම්කරණයන් උපදේශක විසින් සිදු කළ යුතුය. කෙසේ වුවද, එම කාර්යයන් රු.565,870 ක පිරිවැයකට බාහිර පාර්ශවයක් මඟින් සිදු කර ගෙන ව්‍යාපෘතිය විසින් ගෙවීම් නිරවුල් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 6.4 මතභේදයට තුඩු දෙන කරුණු

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ මූලා සැලැස්ම අනුව, 2013 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහය විදේශ සංරචකය යටතේ රු.මිලියන 55.8 කට සමාන ජපන් යෙන් මිලියන 45 ක් වූ අතර දේශීය සංරචකය යටතේ රු. මිලියන 4 ක් විය. කෙසේ වුවද, කාර්ය වැඩ සටහන විධිමත්ව පිළියෙල කර නොතිබූ අතර රු. මිලියන

7.56 කට සමාන ජපන් යෙන් මිලියන 2.91 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි.එබැවින් රු.3,152,321 ක් වූ බැඳීම් ගාස්තු ණය සපයන නියෝජිතායතනය විසින් උපයෝජනය නොකළ මුදල් ශේෂය මත අයකර තිබුණි.

(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු උපලේඛන එෆ් (II) අනුව, එකතු කළ අගය මත බදු නිදහස් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය හිමිකම් ලබයි. කෙසේ වුවද බදු නිදහස් කර ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබූ අතර ඒ සඳහා රු.23,557,307 ක මුදලක් වැය කර තිබුණි.